# ආහාර ලොරි 80 සමඟ එක්සත් ජාතීන් නැවත වන්නියට

ආහාර ද්‍රව්‍ය හා තවත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය රැගත් ට්‍රක් රථ 80 ක් එක්සත් ජාතීන්ගේ නියෝජිතයන් ගේ ආරක්ෂාව යටතේ පසුගිය 26 වැනිදා වවුනියාවේ සිට මුලතිව්, ධර්මපුරම්, හා පුදුකුඩියිරුප්පු යන නැගෙනහිර වන්නියේ නගර තුනක් බලා ගමන් කළ බව වාර්තා විය. එම ට්‍රක්රථ වව්නියාවේදී භාණ්ඩ පුරවා සීල් තැබීමෙන් පසු නැවත ඕමන්තෙයි මුරපොලේදී පරීක්ෂාවට භාජනය නොකළ බවද වාර්තාවන් විශේෂයෙන් සඳහන් කර තිබුණි. ඒ මෙයට පෙර වව්නියාවේදී ආරක්ෂක අංශවල අධීක්ෂණය යටතේ භාණ්ඩ පුරවන ලද්දේ වුවද නැවත ඕමන්තේදී පරීක්ෂාවට භාජනය කිරීම සඳහා තවත් කාලයක් ගැනීම සිදුවූ නිසා විය යුතුය.

මෙසේ කඩිමුඩියේ නැගෙනහිර වන්නි ප්‍රදේශයේ නගර වලට ආහාර යැවීමට ආණ්ඩුව කටයුතු කර ඇත්තේ පසුගිය සතියේ නිව්යෝක් හි පැවැති එක්සත් ජාතීන්ගේ සමුළු වාරයේදී එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බැන්-කි-මූන් විසින් වන්නියේ අනාථ වී සිටින සිවිල් වැසියන් ආහාර හා ඖෂධ නැති කමින් මුහුණ දී සිටින අවාසනාවන්ත ඉරණම ගැන තම දැඩි අවධානය යොමු කිරීමෙන් පසුව බව දේශපාලන නිරීක්ෂකයන්ගේ මතයයි.

නමුත් කිලිනොච්චිය හා කොකාවිල් ප්‍රදේශ අල්ලා ගැනීම සඳහා හමුදාවන් මේ වන විට බරපතල ගුවන් ප්‍රහාර එල්ල කරමින් සිටින නිසා එම ප්‍රදේශ වලට ආහාර තොග යැවීමක් සිදු කර නැති බවද කියැවේ. මේ සම්බන්ධයෙන් අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් එස්.බී. දිවාරත්න පවසා ඇත්තේ කිලිනොච්චියෙන් ජනතාව පිටවී ගොස් ඇති බවත්, එනිසා එය භූත නගරයක් බවට පත් වී ඇති බවත්, සමහරවිට LTTE සංවිධානයේ සාමාජිකයන් පිරිසක් පමණක් සිටිය හැකි බවත්ය.

මෙම ආහාර ට්‍රක් රථවලින් 40 ක් ආණ්ඩුව විසින් සංවිධානය කර ඇති අතර අනෙක් ට්‍රක් රථ 40 ලෝක ආහාර වැඩ පිළිවෙලේ සැපයුම් වෙයි. මෙම ට්‍රක්රථ රැගෙන යැමට එක්සත් ජාතීන්ගේ නිලධාරීන්ට බාර දීමට රජය කටයුතු කර තිබේ. එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සේවකයන්ට වන්නියෙන් පිටවන ලෙස ආණ්ඩුව අණ කිරීමෙන් පසු ගත වූ සති කිහිපය තුළ මේ ප්‍රදේශවලට කිසිම ආහාර ද්‍රව්‍ය සැපයුමක් සිදුවී නැති බවද දැන ගැනීමට තිබේ. මේ සම්බන්ධයෙන් තොරතුරු දක්වා ඇති අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් එස්.බී. දිවාරත්න මෙම ට්‍රක් රථ පෙළ තුල ටොන් 1000 ක් ආහාර හා අනෙකුත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලැයිස්තුවක් පැවැති බවයි. ඒ අතරම ඔහු වැඩි දුරටත් සඳහන් කර ඇත්තේ මෙය පළමු සැපයුම බවත්, ඉදිරි දිනවලදී තවත් ටොන් 4,000 ක ද්‍රව්‍ය එහි යැවීමට කටයුතු කරනු ඇති බවත්ය.